# සාහිත්‍යය හා සමාජයීය වෙනස්කම්

ඩී. එච්. ලෝරන්ස් නම් සාහිත්‍යකරුවා උපත ලැබුයේ 1885 සැප්තැම්බර මාසයේ මධ්‍යම එංගලන්තයේ නොටිංහම්ෂයරයේ (කෝරළයේ) ය. ඔහුගේ පියා පතල් කම්කරුවකු වූ අතර මව කලක් ගුරුවරියක ලෙස සේවය කර ඇත. පියා බීමට ඇබ්බැහිව සිට ඇත. ලෝරන්ස්ගේ ළමා විය ගෙවී ඇත්තේ දුගී පරිසරයක ය. දෙමව්පියන් අතර කිවයුතු තරම් සමගියක් තිබී නැති අතර ඔහු ශිෂ්‍යත්ව ඔස්සේ අධ්‍යාපනය ලබාගෙන ඇත. නොටිංහම් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබීමෙන් පසු ටික කලක් ගුරු වෘත්තියේ ද යෙදී ඇත. ඔහුගේ මව 1910 දී මියගොස් ඇති අතර ඇයට මිය යෑමට ඔහු නිදි පෙති වැඩිපුර දීමෙන් උපකාරි වී ඇත.

1912 දී ෆ්‍රීඩා නම් විවාහක ගැහැණියක හමු වී පසුව ඇය සමග විවාහ වී ඇත. ෆ්‍රීඩා මහත්මිය තම සැමියා ද දරු තිදෙනා ද අත්හැර ලෝරන්ස් මහතා සමග එක් වී ඇත. යුද්ධ කාලයේ දී ලෝරන්ස් මහතා හා මහත්මිය ජර්මන් ඔත්තුකරුවන් ලෙස සලකනු ලැබ ඇති අතර ඔවුන්ට ගමන් බලපත්‍ර නිකුත්කෙරී නැත. යුද්ධයෙන් පසු 1919 දී ඔවහු එංගලන්තයෙන් පිට වී චාරිකාවල යෙදුණහ. ලෝරන්ස් මහතාගේ පළමු නවකතාව 1914 දී පළ වී ඇති අතර ඔහුගේ ප්‍රසිද්ධ ම නවකතාව වූ ලේඩි චැටර්ලිස් ලවර් නම් කෘතිය පළවී ඇත්තේ 1928 දී ය. නවකතා ලිවීමට පෙර සිට ම කවියකු ද වී සිටි ඔහු 1930 දී මිය ගියේ ය.

ඉහත සඳහන් කෙටි විස්තරයෙන් ලෝරන්ස් සාහිත්‍යකරුවා පිළිබඳ යම් අදහසක් ඇති කර ගත හැකි ය. එංගලන්තයේ වික්ටෝරියානු සමාජයට පිටින් ඔහු ජීවත් වී ඇති බව පැහැදිලි ය. වික්ටෝරියානු සමාජයට ඔහු ප්‍රශ්නයක් විය. එහෙත් පසුව ඔහු සමාජයෙහි පිළිගනු ලැබිණි. එසේ පිළිගැනුනේ වික්ටෝරියානු සමාජයක නොව ඉන් පසුව පැන නැගුණු සමාජයක ය. එලෙස පැන නැගුණු සමාජය ඇතිකිරීමට ලෝරන්ස් මහතා ද ආධාර කෙළේ ය. මෙයින් පැහැදිලි වන කරුණක් වනුයේ යමකු පිළිගැනෙන්නේ ඒ පුද්ගලයාගේ අදහස් සමඟ එකඟවන සමාජයක බවත් ඇතැමුන් එවැනි සමාජයක් බිහිකර ගැනීමට ක්‍රියාකරන බවත් ය. තමා පිළිගැනෙන සමාජයක් ඇතිකිරීමට ඇතැම් පුද්ගලයන්ට ඵලදායිකව ක්‍රියාකළ හැකි බවත් මෙයින් පෙනී යයි.

වික්ටෝරියානු කුහකත්වය හා බ්‍රිතානි රජපවුල නමින් පළ වූ ලිපියෙහි ප්‍රබුද්ධයන් කවුරුත් පාහේ කතාකරන එහෙත් නිරවචනය නොකරන මේ කුහකත්වය හඳුනාගැනීමට අපි උත්සාහ කෙළෙමු. අප එහි දී කියා සිටියේ වික්ටෝරියානු කුහකත්වයට මූලික හේතුව වූයේ එංගලන්තය ඇතුළු යුරෝපයේ ඇති වූ චින්තන විප්ලවයට මුහුණ දීමට ඉංග්‍රීසින්ට වූ නො හැකියාව බව ය. අපි මේ කරුණ මෙහි දී තවදුරටත් සාකච්ඡා කරමු. එයට හේතුව නම් වික්ටෝරියානු කුහකත්වයෙන් කැඩීමට ලෝරන්ස් මහතා දැක්වූ දායකත්වය ය. ඇතැම් විට ඒ මහතා එයට එලෙස දායක වූයේ කුඩා කල සිට ම ඒ සමාජ සම්මතවලින් බැටකෑමකට ලක් වී සිටි නිසා විය හැකි ය. එසේ ම කුඩා කල ම ඒ සමාජයේ ව්‍යාජත්වය දැක හැනීමට තරම් තියුණු මනසක් ඒ මහතාට තිබුණා විය හැකි ය.

ඒ කෙසේ වෙතත් යුරෝපයේ ඇති වූ චින්තන පෙරළියට ඉහළ ම දායකත්වයක් දී ඉන් ආර්ථික හා වෙනත් ඵල නෙළා ගැනීමට එංගලන්තය සමත් වූ නමුදු ඒ සඳහා ආයතන හැඩ ගස්සවා ගැනීමේ දී නම් ඉංග්‍රීසින් එතරම් දක්ෂතාවක් දන්වා ඇති බවක් නො පෙනෙයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ සුසමාදර්ශය වන නිව්ටෝනීය සුසමාදර්ශය සකස්කර ලෝකයට දීමට සමත් වූ ඉංග්‍රීසින්ට ආයතන ගොඩනගා ගැනීමේ දී පසු බැසීමට සිදු වූයේ ඔවුන්ට ඉතිහාසය පිළිබඳ විඥානයක් සතු වූ නිසා විය හැකි ය. ඉතා මෑතක් වන තුරුම සිංහලයන්ට ද ඓතිහාසික විඥානයක් තිබූ බව සඳහන් කළ යුතු ය.

ආයතන ගොඩනගා ගැනීම සම්බන්ධයෙන් ඉංග්‍රීසින් දැක්වූ අදක්ෂතාව ප්‍රංශය සමග සංසන්දනය කිරීමෙන් වැඩිදුරටත් අවබෝධ කරගත හැකි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සාමූහිකත්වය වෙනුවට පෞද්ගලිකත්වය ප්‍රධාන තැනෙහි ලා සලකයි. පුද්ගල ඉන්ද්‍රිය පිනවීමට හැකි සෑම ඉඩකඩක් ම සපයයි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය කතෝලික චින්තනයට වඩා වෙනස් වෙයි. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි විවිධ ක්‍රිස්තියානි නිකාය නිහිවීම ද අපේ අවධානයට ලක්විය යුතු ය.

© Prof. Nalin De Silva

එක් කලෙක බටහිර යුරෝපයෙහි සියළු රටවල් පාහේ පාප් වහන්සේගේ ආධිපත්‍යයට යට වු කතෝලික රටවල් විය. එංගලන්තය පාප් වහන්සේගෙන් කැඩී ක්‍රිස්තියානි විය. එයට ප්‍රධාන හේතුවක් වූයේ අටවැනි හෙන්රි රජුට දික්කසාද වී නැවත විවාහයකට එළඹීමට වු අවශ්‍යතාව ය. එහෙත් කතෝලික සංස්කෘතියෙහි හා ආගමෙහි එයට ඉඩක් නො තිබුණි. අටවැනි හෙන්රි රජු තමාගේ නායකත්වයෙන් වෙන ම ආගමක් ඇතිකරගත්තේ ය. ඒ සඳහා එවකටත් ඇතිව තිබූ බටහිර ක්‍රිස්තියානි නූතනත්වය ආධාර විය. එහෙත් ප්‍රංශය ප්‍රංශ විප්ලවයෙන් පසුවත් කතෝලික රටක් විය. ප්‍රංශ විප්ලවයෙන් ජනතාව ආගමින් තවදුරටත් කතෝලික වූ නමුත්, සංස්කෘතියෙන් ක්‍රිස්තියානි විය. එහි මධ්‍යකාලීන වැඩවසම් කතෝලික ආයතනයක් වූ රාජාංඩුව විනාශකර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආයතනයක් වූ ජනරජයක් නැත්නම් සමූහාණ්ඩුවක් පිහිටුවන ලදී.

පෞද්ගලිකත්වය පිළිබඳ අදහස් වඩාත් වර්ධනය වූයේ ප්‍රංශයෙහි ය. පුද්ගල නිදහස ගැන අර්ථකථන දුන් වෝල්ටෙයාර් මෙන් ම පෞද්ගලිකත්වයේ අධ්‍යාපනඥයකු හා දාර්ශනිකයකු වූ රූසෝ වැන්නෝ ප්‍රංශයෙහි උපන් හ. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ චිත්‍ර කලාව පමණක් නොව නවකතා හා කෙටිකතා ද වර්ධනය වූයේ ප්‍රංශයෙහි ය. රුසියානු නවකතා හා කෙටිකතා ද ආභාසය ලැබුයේ ප්‍රංශයෙනි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ලෝක ආධිපත්‍යය දැරීමට ප්‍රංශයට සුදුසුකම් රාශියක් තිබුණි. එහෙත් ඒ තැනට පත්වූයේ එංගලන්තය ය. එංගලන්තයට ආර්ථික ශක්තියක් හා එයටත් වඩා හමුදා ශක්තියක් තිබුණි. අවසානයේ දී එංගලන්තයට පිහිටවූයේ මේ හමුදා ශක්තිය ය. එංගලන්තයේ හමුදා ශක්තියට අභියෝගයක් එල්ල කිරීමට සමත් වූ ප්‍රංශ ජාතිකයා නැපෝලියන් විය. එහෙත් ඔහු ද අවසානයේ දී එංගලන්තයට පරාද විය. අද ඇමරිකා එක්සත් ජනපදයට ද ඇත්තේ සුපිරි යුද්ධ ශක්තියකි.

එංගලන්තය ආගමින් ක්‍රිස්තියානි වුව ද, නිව්ටෝනීය සුසමාදර්ශය බිහිකළ ද, කාර්මික විප්ලවයට නායකත්වය දුන්න ද, ධනේශ්වර ආර්ථිකයක් ඇතිකිරීමට සමත්වුව ද, පාර්ලිමේන්තුවක් පිහිටුවුව ද, ඒ ක්‍රියා දාමයන් එකකටවත් රටේ ජනතාවගේ සහභාගීත්වය ලබා නොගත්තේ ය. එංගලන්ත ඉතිහාසයෙහි ක්‍රොම්වෙල්ලා, බෙකට්ලා ආදීහු ජනතාවගෙන් වෙන්වූවෝ වූහ. එංගලන්තයේ පාර්ලිමේන්තුව ඇතිවූයේ ද අවුරුදු සිය ගණනක් කෙරී ගෙන ගිය ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස ය. ඒ ක්‍රියාවලියෙහි ජනතා සහභාගීත්වය අවමයක් විය.

එහෙත් ප්‍රංශ විප්ලවය එසේ නො වීය. ඒ දිග්ගැසුණු අරගලයක් නො වී ය. එයට ජනතා සහභාගීත්වයක් විය. එංගලන්තයේ විප්ලව ජනතාවට උඩින් සිදු වූ අතර ප්‍රංශයෙහි විප්ලව මුළු සමාජයෙහි ම සිදු විය. මාක්ස්වාදී අදහසකට අනුව ඊනියා තුන්වැනි ලෝකයේ රටවල ධනපති පංතියට ජාත්‍යන්තර ධනේශ්වරයෙන් තොරව පැවැත්මක් නැත. ඒ කෙසේ වෙතත් එංගලන්තයේ නැගී ආ ධනපති පංතිය කිසි විටෙකත් ජනතාව විශ්වාස කළ බවක් පෙනෙන්නට නැත. ක්‍රිස්තියානි නූතනත්වයෙහි නායකත්වයෙහි වූවන්ට පැරණි වැඩවසම් කතෝලික සංස්කෘතියෙහි නායකයන්ට එරෙහිව ජනතාව සහභාගි කර ගනිමින් ගෙන ගිය අරගලයක් නො වී ය. අනෙක් අතට එංගලන්තයේ ආරම්භයේ දී ම කතෝලික සංස්කෘතියට එරෙහිව අරගලය කෙළේ රජු ය. එහෙත් රජු පෞද්ගලිකත්වයට ඉඩක් දුන්නෙක් නො වී ය. රජු ද රදලයෝ ද පූජකවරු ද ඉඩම් හිමියෝ වූහ. කතෝලික චින්තනයෙහි යුරෝපීය වැඩවසම් යුගයෙහි ජනතාව ඉඩම්වලට බැඳ ඒ ඔස්සේ පෞද්ගලිකත්වය නැතිකර තිබුණි.

දහඅටවැනි සියවසේ දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට එංගලන්තයේ දී කළ යුතුව තිබුණේ ද කෙරුණේ ද ජනතාව ඉඩම්වලට බැඳ තිබූ බැම්මෙන් නිදහස් කිරීම ය. දහඅටවැනි සියවසෙහි ඒ බැම් සැහෙන ප්‍රමාණයකට ගලවා ගැමියන් නගරයට යවා තිබුණි. ගෝල්ඩ්ස්මිත් නම් සුප්‍රසිද්ධ ඉංගිරිසි කවියා මේ තත්වය ගැන මහත් විමසිල්ලෙන් හා කණස්සල්ලෙන් සිටි බව ඔහු විසින් 1770 දී පළකරන ලද " ද ඩෙසර්ටඩ් විලේජ් " (The deserted village – පාළුගම) නම් කාව්‍යයෙන් පැහැදිලි වෙයි. ඉංගිරිසි ගැමියන් ඉඩම්වලට බැඳ තිබීමෙන් යම් සමස්තයක් ගැන හැඟීමක් ඔවුන්ට තිබෙන්නට ඇත. ඉඩම්වලට තිබූ බැඳීම කැඩුණු පසු ඔවුහු තම තමන්ගේ ශ්‍රමය විකිණීමට නගරයට ගියහ. ඉඩම්වලින් මුදනු ලැබූ ඔවුන්ට විකිණීමට තිබුණේ ශ්‍රමය පමණකි. මාක්ස්වාදයෙහි කියැවෙන කම්කරුවන් ඇතිවුණේ මොවුන්ගෙනි.

© Prof. Nalin De Silva

එංගලන්තයෙහි ජනතාව ඉඩම්වලට බැඳ තිබූ බැම්වලින් නිදහස් කිරීමෙන් ඔවුන්ගේ පෞද්ගලිකත්වය ඉදිරියට පැමිණියේ යැයි කිව නො හැකි ය. එක්තරා ආකාරයකින් ගතහොත් ඒ ජනතාව ඉඩම හා බැඳුණු සමාජයීය ආකල්පවලින් ගලවා දමනු ලැබූ නමුත් ඔවුන්ට පෞද්ගලිකත්වයක් යනුවෙන් දෙයක් ගොඩ නො නැගුණි.. පෞද්ගලිකත්වයේ දර්ශනයක් හෝ ඉදිරි දැක්මක් හෝ එංගලන්තයට බිහිකර ගැනීමට නො හැකි විය. එංගලන්තය කතෝලික චින්තනයෙන් කැඩුණු නමුත්, බටහිර විද්‍යාව වර්ධනය කරගැනීමට අවශ්‍ය පසුබිමක් හා දර්ශනයක් සකස් කරගත් නමුත්, ගමේ ඉඩම්වලින් කැඩී ආ අයට නගරයේ කර්මාන්තශාලා ඇතිකර දුන් නමුත්, ජනතාවට පෞද්ගලිකත්වය වර්ධනය කිරීමට නො හැකි විය. එංගලන්තයේ පළමුව ඇතිවූයේ ශිල්ප ශ්‍රෙණි (guilds) බව අමතක නොකළ යුතු ය. පසුව දහඅටවැනි සියවසෙහි ස්කොට්ලන්තයෙන් පැමිණි ඇඩම් ස්මිත් විද්වතාට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ආර්ථික න්‍යාය එංගලන්තයේ ශිල්ප ශ්‍රෙණි ආකෘතියට එරෙහිව නිර්මාණය කිරීමට සිදු විය.

බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට සෘජුව ම හා සමාජයීය විඥානයකින්, ඒ ඒ පුද්ගලයා වශයෙන් ගත්කල අවිඥානිකව හැඩගැසීමේ අපහසුවක් එංගලන්තයට මුල සිට ම තිබූ බව පෙනී යයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට හැඩ ගැසෙන්නේ කෙසේ දැයි කියාදීමට බුද්ධිමතුනට සිදුවිය. ඇඩම් ස්මිත් විද්වතා ආර්ථිකයෙහි ඇතිකළ වෙනස්කම් වුව ද පෞද්ගලික චර්යාවට බල නො පෑවේ ය. චර්යාව ලෙස ගතහොත් මිනිසුන් දිගින් දිගට ම ජීවත්වූයේ මධ්‍යකාලීන වැඩවසම් කතෝලික චින්තනයෙහි ය. අටවැනි හෙන්රි රජුගේ විවාහය  මුල්කරගෙන එංගලන්තය කතෝලික චින්තනයෙන් කැඩුන ද, ජනතාව විවාහය හා  ලිංගිකත්වය සම්බන්ධයෙන් ඇදහුයේ, එනම් පොදුවේ පිළිගත්තේ කතෝලික චින්තනයෙන් ඉදිරිපත් කළ කරුණු ය. එහෙත් ඔවුහු තනි තනි ව ගතහොත් වෙනත් ආකල්පවල සිටියහ. ලෝරන්ස් විද්වතාට ඓතිහාසිකව උරුම වූ කාර්යභාරය වූයේ ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ජනතාව සමාජයීය වශයෙන් ම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට ගැනීම ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva